# දිනන දකුණ

දක්ෂිණාංශික දේශපාලනය ප්‍රතිස්ථාපනය කිරීමේ සාමූහිකය.

**2027න් පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහන අතහැර දැමීම ආර්ථික අගාධයකට ඇද වැටීමකි!**

දිනන දකුණ සාමූහිකයෙන් රජයට කෙරෙන විවෘත ඉල්ලීමයි!

ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ පුරවැසියන්ට කෙරෙන සිහිපත් කිරීමයි!

ශ්‍රී ලංකාව මුහුණ දුන් අවාසනාවන්ත ආර්ථික අර්බුදයෙන් පසු බිඳෙනසුලු නමුත් ආර්ථික ප්‍රතිස්ථාපනයක් කරා ගමන් කරමින් සිටින මොහොතක, අඛණ්ඩව ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මූල්‍ය රාමුවෙන් බැහැර කරන දේශපාලන වාචාල කතාවලට යටත් වීම දැඩි ලෙස ප්‍රතික්ෂේප කළ යුතු යයි අප සාමූහිකය විශ්වාස කරයි.

2027 මාර්තු මස වත්මන් විස්තීර්ණ අරමුදල් පහසුකම (EFF) අවසන් වීමෙන් පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති ව්‍යුහාත්මක සබඳතාව හදිසියේ අත්හැර දැමීමට ආණ්ඩුවේ ඇතැම් පාර්ශ්වයන් කටයුතු කරමින් සිටින බව අප  සාමූහිකය නිරීක්ෂණය කරමින් සිටින අතර එම ප්‍රවණතාවය අනතුරුදායක මතවාදී සූදුවක් බව අප සාමූහිකයේ මතය වන්නේය.

ජනකාන්තවාදී දේශපාලනයෙන්  පෝෂණය වන ශ්‍රී ලාංකික දේශපාලන සමාජය සහ ආණ්ඩුවේ තීරණ  ගැනීමේ ක්‍රියාවලිය IMF විසින් පනවනු ලබන නමුත් ස්වයං ආයතනික ආර්ථික විනයකින් තොරව ස්වාධීන සහ හුදෙකලා ආර්ථික ගමනක් යා හැකි යැයි රටේ ඇතමකු දරන මතය අපගේ රාජ්‍ය ආර්ථික ශේෂ පත්‍රයේ ඇති කටුක යථාර්ථය නොසලකා හැරීමක් ලෙස අප දකින්නෙමු.

රට නැවතත් ජනකාන්ත වාදී දේශපාලනයේ ගොදුරක් වන්නේ නම් සහ අතාර්කික ලෙස සහනාධාර ලබා දෙන ආර්ථිකයකට නැවත ප්‍රවිශ්ඨ වන්නේ නම් අප රටක් ලෙස දුෂ්කරතා මධ්‍යයේ දිනාගත් මේ බිඳෙනසුළු ස්ථාවරත්වය මුළුමනින්ම විනාශ වී රට යළිත් බංකොලොත් භාවයේ අගාධයට ඇද වැටෙනු ඇත.

එම නිසා අප කියන්නේ මෙවර අයවැය තුලින් හඳුන්වා දෙන්නට යෝජිත ඇතැම් ආර්ථික සහන" සඳහා යටත් වන  රජයේ වියදම් හැඳින්විය හැක්කේ වෙස්වළාගත් මූල්‍ය අපතේ යැවීම් බව අපගේ මතයයි.

2027 අයවැය අපේක්ෂිත මුළු රජයේ වියදම රුපියල් ට්‍රිලියන 4.99ක් ලෙස දක්වා ඇති අතර ණය සීමාව රුපියල් ට්‍රිලියන 3.8ක් ලෙස සීමා කර ඇත.

ඒ අනුව රුපියල් ට්‍රිලියනයකට ආසන්න මුදලකට ආසන්න වියදම් මෙරට ආදායම් ප්‍රභවයකින් සමනය කල නොහැකි නමුත් ණය ලබා ගැනීමෙන් පමනක් සමනය කල හැකි වියදම් වන්නේය.

අතීතයේදී සිදුවූ පරිදිම මෙය ධනය උත්පාදනය නොකොට ණය ලබා ගෙන එම ණය ධනය බෙදාහැරීමක් ලෙසට සිදු කිරීමට  දරන මරීමෝඩ දේශපාලනයේ ප්‍රතිපලයක් බව අප සාමූහිකය කියා සිටී.

ජනකාන්තවාදී දේශපාලන ප්‍රවණතා අනුබල දෙන්නේ ආවරණයකින් තොර මහජන වියදම්, තහවුරු නොකළ ආර්ථික සහන සහ රාජ්‍ය අනුග්‍රහය මත පදනම් වූ ක්‍රමවේදවලටය.

ව්‍යුහාත්මක නිර්නායක, ප්‍රාථමික අයවැය ඉලක්ක සහ වියදම් සීමා කිරීම්වල දැඩි, නීතිගත විනයක් නොමැති නම්, දේශපාලන වාසිවාදී අරමුණු පෙරමුණට පැමිණෙනු ඇති අතර, එයින් දේශීය උද්ධමනය ඉහළ යෑමට, විදේශ සංචිත සිඳී යාමට සහ සාමාන්‍ය පුරවැසියාගේ ක්‍රමික මිලදී ගැනීමේ ශක්තිය ක්ෂය වීමට හේතු වනු ඇත.

2027 න් පසුව මාලිමා රජය අනුගමනය කරන්නට යන්නේ පූර්ව බංකොලොත් යුගයන්හිදී මෙරට ක්‍රියාත්මකවූ රජයන් තම දේශපාලන පැවැත්ම සඳහා අනුගමනය කල මෙම අමනොඥ ආණ්ඩුකරණය් නම් ඉන් රටට අත්වන්නේ විනාශයක් මිස සුගතියක් නොවේ.
ඒ අනුව 2027න් පසු IMF රාමුව ප්‍රතික්ෂේප කිරීම විනාශකාරී වන්නේ ඇයිද යන්න මෙවර මාලිමා රජය විසින් ඉදිරිපත් කරනු ලබන පූර්ව අයවැය දත්ත මගින් හොඳාකාරව පෙන්වා දෙනු ලබයි.

මෙහිලා අප සාමූහිකය තවදුරටත් කියා සිටින්නේ මාලිමා ආන්ඩුව මෙවැනි අමනෝඥ සහන පැකේජයක් ඉදිරිපත් කිරීම සඳහා හේතුවී ඇති බව පෙනෙන්නට තිබෙන්නේ තමන් ඉදිරියේ පවතින 2028 ණය උගුල පිලිබඳව තාර්කික විශ්ලේෂනයකින් තොරව බව අපගේ නිරීක්ෂනය වන්නේය.

ඒ අනුව මාලිමා රජය සිතන බව පෙනෙන්නේ එම ණය උගුලෙන් ගොඩයාම සඳහා ජාත්‍යන්තර ණය වෙළඳපොළට පිවිසීමේ මිත්‍යාව තුල තම විකල්පයන් ස්ථානගත කරමින් සිටින බවයි.

ශ්‍රී ලංකාවේ වත්මන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ එකඟතා සහ සහන කාලයන් අපට තාවකාලික හුස්ම ගැනීමට ඉඩ සලසා දී ඇතත්, දැවැන්ත ප්‍රාග්ධන ආපසු ගෙවීම් සහ ණය සේවාකරණ වගකීම් 2028 වසර වන විට දැඩි ලෙස ඉහළ යනු ඇත.

සංවර්ධනය වෙමින් පවතින රටකට ක්‍රියාකාරී IMF වැඩසටහනක ආයතනික අනුමැතියකින් තොරව ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළට බාධාවකින් තොරව යළි පිවිසීමට සහ ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීමට හැකි යැයි සිතීම අනතුරුදායක මිරිඟුවකි.

එම නිසා අපට  ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පරිවාසය තවදුරටත් වලංගු සාධකයක් වන්නේය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පරිවාසය නොමැති නම්, ආයෝජක විශ්වාසය බිඳී යනු ඇත, අවදානම් සහිත වාරික අහස උසට නැංවෙනු  ඇත.

එවැනි ක්‍රියාවලියක් තුල රටට ණය ගැනීමේ පිරිවැය දරාගත නොහැකි මට්ටමකට ඉහළ යනු ඇත.
එම නිසා අප මාලිමා ආණ්ඩුවට බලකොට සිටින්නේ මේතාක් දුරට තමන්ගේ ආණ්ඩුව මෙන්ම ඊට පෙර පැවති රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා අනුගමනය කරන ලද ආර්ථික ප්‍රායෝගිකවාදය තව
දුරටත් ඉදිරි වසර කිහිපයකට හෝ අනුගමනය කරන ලෙසටය.

ඒ සඳහා ජනකාන්තවාදී දේශපාලන වාචාලකම්වලින් එපිටට ගිය ප්‍රඥාශීලී ප්‍රතිපත්ති පෙරමුණට නායකත්වය ලබා දෙන ලෙසටය.

එම නිසා රටේ මිලියන 22ක ජනතාවකගේ අනාගත මූල්‍ය ආරක්ෂාව අවදානමකට ලක් කරමින් බහුපාර්ශ්වික ආයතන කෙරෙහි ඇති මතවාදී අගතියකට ඉඩ දීමට සුදුසු වාතාවරණයක් රට ඉදිරියේ නොමැති බව අප සාමූහිකය අවධාරණය කර සිටී

එසේ හෙයින් අප මාලිමා රජයට බලකොට සිටින්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග 2027 පසුව අනුප්‍රාප්තික වැඩසටහනක් ආයතනගත කිරීම රටේ ජනතාවගේ කෝණයෙන් බලන කල රටේ අනාගතය සඳහා අත්‍යවශ්‍යය  පූර්ව කොන්දේසියක් වන බවයි.

අප සාමූහිකය විශ්වාස කරන්නේ වත්මන් IMF වැඩසටහන අවසන් වීම රටේ ණය ආර්ථිකයෙන් මිදීමට යන ගමනේ හුදෙක් පළමු සන්ධිස්ථානය පමණක් බව ආණ්ඩුව වටහා ගත යුතු බවය.

එම නිසා ඉදිරි විදේශීය ණය ආපසු ගෙවීමේ චක්‍රය කළමනාකරණය කර ගැනීම සඳහා 2027න් පසු අනුප්‍රාප්තික නිරීක්ෂණ රාමුවකට හෝ මධ්‍යකාලීන වැඩසටහනකට බාධාවකින් තොරව පිවිසීම අත්‍යවශ්‍යවී තිබේ.

එවැනි පසුබිමක රාජ්‍ය මූල්‍ය විනය දැඩි ලෙස අනුගමනය කිරීම සහ රාජ්‍ය මූල්‍ය හිඟයට දායක වන දේශපාලන අභිප්‍රායන් මත පදනම් වූ සහනාධාර පද්ධති වෙත යළි යාමෙන් වැළකී, රාජ්‍ය ව්‍යවසායන් සඳහා විනිවිදභාවයෙන් යුත් පිරිවැය-ප්‍රතිසාධන මිලකරණ ක්‍රමවේද පවත්වාගෙන යාම රාජ්‍යකරනයේ අත්‍යවශ්‍ය කැපවීමක් ලෙස අප දකිමු.
කෙටිකාලීන ජනකාන්තවාදයට වඩා දිගුකාලීන ස්ථාවරත්වයට මුල්තැන දීමේ පියවරක් ලෙස මෙම පියවරට රට ගෙනයායුතුව තිබේ.

ආර්ථික ස්වෛරීභාවය යනු රට ගෝලීය මූල්‍ය රාමු වලින් හුදකලා කිරීමෙන් ආරක්ෂා වන්නක් නොවේ.
රටේ ආර්ථික ස්වෛරීත්වය බිඳ නෙහෙලිය යුතු බාහිර ආරක්ෂක කුළුණු, විශ්වාසදායක අපනයන මාර්ග සහ නොසැලෙන ආයෝජක විශ්වාසය ගොඩනැඟීම මඟින් තහවුරු කරගත යුත්තකි.
පාලකයන් ජනප්‍රියවාදී උන්මාදයට යට වී ගෝලීය ආර්ථික පද්ධතියට අවශ්‍ය ආයතනික විනය ඉවත දැමුවහොත්, පසුගිය වසර කිහිපය තුළ දුෂ්කරතා මධ්‍යයේ දිනාගත් ජයග්‍රහණ එක රැයකින් විනාශවී යනු ඇත.

එය රට නැවතත් බංකොලොත් රාජ්‍යයක් බවටත්, පුරවැසියා අන්ත අසරණ තත්ත්වයකටත් පත් කරනු ඇත.

දිනන දකුණ සාමූහිකය වෙනුවෙන් නායකත්ව මණ්ඩලය සහ විධායක සභාව.